# නාගරීකරණය සහ අපරාධ අතර පවත්නා සබඳතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**Shyamali WMW[1], Wijewardhana BVN[2], Samarakoon MT[3]**

[13]Department of Sociology, University of Sri Jayewardenepura[1]

[2]Department of Criminology & Criminal Justice, University of Sri Jayewardenepura[2]

*wathsala.shyamali3@gmail.com*

**සාරාංශය**

*සමාජ විද්‍යාත්මකව නාගරීකරණ ක්‍රියාවලිය කාර්මීකරණය, නවීකරණය සහ තාර්කීකරණ ක්‍රියාවලිය සමග සමීපව බැඳී එන්නකි. නාගරීකරණය හේතු කොට ගෙන සමාජය තුළ විවිධ අවස්ථාවන් පුද්ලයන්ට හිමි වේ. එනම් රැකියා, උසස් අධ්‍යාපන, නිවාස වඩා පහසු ගමනාගමන සහ රාජ්‍ය පරිපාලනමය කටයුතු පහසු කර ගැනීමද මෙ තුළින් සිදු වේ. නගර ආශ්‍රිත වැසියන්ට මෙම ආර්ථික තත්ත්වයන් ළගා කර ගැනීමට නොහැකි වීම මත ඇතිවන සමාජීය ගැටලු බොහෝ ලෙස වාර්තා වේ. බොහෝ ආනුබවික අධ්‍යයනයන් මගින් වාර්තා වී ඇති පරිදි නාගරික ප්‍රදේශවල අපරාධ සිදුවීමේ ප්‍රනතාව ඉතා ඉහළ මට්ටමක පවතින ආකාරයක් පෙනේ. නාගරීකරණය සහ අපරාධ අතර සබඳතාවක් පවතින්නේද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව විය. නාගරීකරණය සහ අපරාධ අතර පවත්නා සබඳතාව හඳුනාගනිමින් ඒවා වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. නාගරික සමාජයේ සිදුවන අපරාධයන්ට ප්‍රධානතම හේතුව ලෙස ප්‍රජාවගෙන් ලැබුණු පිළිතුරු වූයේ මත්ද්‍ර්‍ය භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව අධික වීමයි. සිය අවශ්‍යතාවන් සපුරා ගැනීමට සහ අනන්‍යතාවය සඟවා කටයුතු කළ හැකි පරිසරයක් නාගරිකබව තුළ තිබීම මත අපරාධ කෙරෙහි යොමුව මුදල් පසුම්බි සොරකම, මත්ද්‍රව්‍ය භාවිතය, ගණිකා වෘත්තිය, මිනීමැරීම්, මංකොල්ලකෑම් සහ ස්ත්‍රී දූෂණ ආදී අපරාධ සිද්ධීන් ඒ අතර ප්‍රධාන වී ඇත. පටු මංමාවත්, ගරා වැටුණු ගොඩනැගිළි තුළ සහ අපරාධ කිරීම සඳහා නිර්මාණය කරගත් ඇතැම් ස්ථාන (Hotspot) මූලික කරගෙන අපරාධයන් බහුලව සිදුවන බව නිරීක්ෂණය විය. නගරාශ්‍රිතව අපරාධ පාලනය කිරීමෙහිලා නගර සැලසුම්කරණ ක්‍රියාවලිය නිසි පරිදි සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. ලෝකයේ බොහෝ රටවල් වර්තමානයේ පාරිසරික සැලසුම් මගින් අපරාධ වැළැක්වීමේ ක්‍රමය (CPTED) යොදා ගනිමින් නාගරික අපරාධ වැළැක්වීම පිළිබඳ අවධානය යොමු කිරීම කාලෝචිතය.*

**මුඛ්‍යපද- අපරාධ, අපරාධ ප්‍රවනතාව, නාගරීකරණය, CPTED**

## 1. හැඳින්වීම

ඉතා සීග්‍රයෙන් ගම්බද සංස්කෘතිය විසින් නාගරික සංස්කෘතිය ආදේශ කරගනු ලබන නාගරීකරණ ක්‍රියාවලිය නූතන ප්‍රපංචයක් නොවන අතර එය මානව ජීවිතයේ මූලාරම්භයේ සිටම විකාශනය වෙමින් පවතින්නක් බව පෙන්වා දිය හැකිය. එක්සත් ජාතීන්ගේ ජනගහන කාර්යංශයට අනුව නගර හෝ නාගරික ප්‍රදේශයන්හි සීමා නිර්ණයන් හඳුනාගැනීම පිළිබඳ ඒකමතික භාවයක් නැත. ඇතැම් පර්යේෂකයන් ජනගහන ඝනත්වය හා ජනගහන ප්‍රමාණයන් යන නිර්ණායක පදනම් කොටගෙන නගර නිර්වචනය කර ඇති අතර ඇතැම් රටවල් එවැනි නිර්වචන අනුමත කර ඇත. කෙසේ වුවද බොහෝ රටවල නගර ලෙස හඳුන්වන ලබන ජනාවාස තුළින් පරිපාලනමය කටයුතු ඉටු කිරීමට බලාපොරොත්තු වේ. කලාතුරකින් භෞතික ලක්ෂණ පමණක් පදනම් කර ගන්නා අතරම සමහර රටවල් නගරවල විශාලත්වය, ඝනත්වය, පරිපාලනමය මට්ටම් හා යටිතල පහසුකම් හා වෙනත් පහසුකම් ආදිය සැලකිල්ලට ගෙන නගර හඳුන්වා දෙනු ලබයි (Gordon and David, 2014). යම් ප්‍රදේශයක් නාගරික යැයි සම්මතයක් ලෙස පිළිගැනෙන්නේ එහි අධික ජන සංඛ්‍යාවක් අධික ජනඝනත්වයක් හෝ ශ්‍රම

බලකායෙන් වැඩි පිරිසක් කෘෂිකාර්මික නොවන රැකියාවල නියුක්ත වීමත් යන මූලික සාධක සැලකිල්ලට ගැනීමෙනි (ද සිල්වා, 2004).

කාර්මීකරණය සමග විශාල වශයෙන් කර්මාන්ත ශාලා ව්‍යාප්ත වූ අතර එම කර්මාන්ත ශාලාවල සේවය සඳහා ග්‍රාමීය නොදියුණු ප්‍රදේශවල ජනතාව ක්‍රමයෙන් කර්මාන්ත ස්ථානගත වූ ප්‍රදේශ කරා සංක්‍රමණය විය. මෙම ශීඝ්‍ර ජන සංක්‍රමණවල ප්‍රතිඵලයක් වශයෙන් කර්මාන්ත ස්ථානගත වූ ප්‍රදේශ ආශ්‍රිතව විශාල වශයෙන් ජනගහනය සංකේන්ද්‍රණය වන්නට විය. එම නිසා කර්මාන්ත ස්ථානගත වූ ප්‍රදේශ ආසන්නයේ ක්‍රමිකව නාගරික ලක්ෂණ ඇති වෙමින් නාගරීකරණයට ලක් විය. මෙම හේතුව නිසා නාගරීකරණය ඇති වූ බව පෙන්වාදිය හැකිය. ඒ අනුව කාර්මික විප්ලවය හරහා ඇති වූ තාක්ෂණික දියුණුව ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ දෙක කෙරෙහිම බලපා තිබේ (Gelles & Levine, 1999). මෙම නාගරීකරණය අද්‍යතනය වන විට නොවැළැක්විය හැකි ක්‍රියාවලියක් වශයෙන් හඳුනාගත හැකිය. නාගරීකරණය පිළිබඳව සංඛ්‍යා දත්ත පිළිබඳව සැලකිලිමත් වීමද මෙහිදී වැදගත් වන්නේය. 1900 වර්ෂයේදී 10%ක් වූ නාගරීකරණය 2000 වර්ෂය වන විට 50%ක් දක්වා වර්ධනය වී තිබේ (Schaefer, 2005). ගෙල්ස් හා ලෙවින් නාගරීකරණය යන්න හඳුන්වනුයේ නාගරික ප්‍රදේශවල පදිංචි ජනගහනයේ වර්ධනයයි. ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂයට අනුව නාගරීකරණය යනු නාගරික බව ඇති (විජේතුංග, 2008).

නගරය පිළිබඳ ප්‍රථම ප්‍රජා විද්‍යාත්මක නිර්වචනය ඉදිරිපත් කර ඇති සමාජ විද්‍යාඥයකු වූ ලුවිස් වර්ත් (Louis Worth) 1938 දී ලියන ලද Urbanism as a way of life නම් ලිපියෙහි නගරය අර්ථකථනය කොට ඇත්තේ ගති ලක්ෂණ 4ක් පදනම් කොට ගෙනය. එනම්,

1.නිත්‍යතාව / ස්ථිර බව
2.විශාල ජනගහන ප්‍රමාණය
3.අධික ජනඝනත්වය
4.සමාජ විෂමජාතිත්වය (Worth, 1938).

මොහුගේ අදහසට අනුව නාගරීකරණය හා සම්බන්ධ වැදගත් කරුණු දෙකක් හඳුනාගත හැකිය. එනම් තනි පුද්ගල ජීවිත හුදෙකලා භාවයට පත් වීම ඉන් පළමු වැන්නයි. දෙවැන්න වන්නේ සමාජ අසංවිධිතභාවයයි. උක්ත සියලු නිර්වචන සැලකිල්ලට ගැනීමේදී දක්නට ලැබෙනුයේ නගරයක ජන සංඛ්‍යාව මෙන්ම ජන ඝනත්වය ද ඉහළ අගයක් ගන්නා බවයි. කෘෂිකාර්මික නොවන අංශයක් වටා මිනිසුන් ඒකරාශි වීම, නාගරික භූමිය තුළ වගා කටයුතු සිදු නොවීම මෙන්ම නගරයක විවිධත්ව ජාතීන් ඇතිවීම මෙන්ම නගරයක විවිධත්ව ජාතීන් අනුව, කාර්යයන් අනුව, සමාජ ආර්ථික මට්ටම හඳුනාගත හැකිවීම යනාදී මූලික ලක්ෂණයයි. ග්‍රාමීය සමාජ තුළ බොහෝ වශයෙන් දැකගත හැකි වන්නේ එකම කුලයකට මෙන්ම එකම ඥාති පදනමකට අයත් පිරිසකි. නමුත් නගරය තුළ නිරන්තරයෙන් දැකගත හැකි වන්නේ විවිධ පන්තීන් නියෝජනය කරනු ලබන විෂමජාත්තිත්වයකින් නිර්මාණය වූ පුද්ගල කණ්ඩායමකි. එහි අනිවාර්ය ලක්ෂණය වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව ඉතා ඉහළ ජන ඝනත්වයක් දැකගත හැකි වීමයි. නාගරීකරණය සඳහා බලපානු ලබන ප්‍රධාන හේතු සාධක 4ක් රින්කේෂ් විසින් (Rinkesh) පහත පරිදි දක්වයි.

1. කාර්මීකරණය

2. වානිජකරණය

3. සමාජ ප්‍රතිලාභ හා සේවා

4. රැකියා අවස්ථා සහ සේවාවන්

5. ජීවන රටාවේ නවීකරණ හා වෙනස්කම්

6. ග්‍රාමීය නාගරික ප්‍රවාහනය (Rinkesh, 2009).

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ නාගරික යැයි සම්මත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ නාගරික අංශය යටතට අයත්වන මහ නගර සභා ප්‍රදේශ සහ නගර සභා ප්‍රදේශයන්ය. මෙරට නාගරික ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය ජන හා නිවාස සංගණනය - 2012 වාර්තා අනුව පැහැදිලි වේ.

**වගු අංක 2.7 - නාගරික ජනගහනය 1871-2012**

| සංගණන වර්ෂය | නාගරික ජනගහනය | % |
|---|---|---|
| 1881 | 281,065 | 10.2 |
| 1891 | 321,413 | 10.7 |
| 1901 | 414,025 | 11.6 |
| 1911 | 542,945 | 13.2 |
| 1921 | 637,870 | 14.2 |
| 1931 | 737,272 | 13.9 |
| 1946 | 1,023,042 | 15.4 |
| 1953 | 1,239,133 | 15.3 |
| 1963 | 2,016,285 | 19.1 |
| 1971 | 2,848,116 | 22.4 |
| 1981 | 3,192,489 | 21.5 |
| 2001 | 2,467,301 | 13.1* |
| 2012 | 3,704,470 | 18.2 |

* ඇස්තමේන්තුගත අගයකි

(ජන හා නිවාස සංගණනය, 2012).

2017 වන විට ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය 4,050,307 දක්වා වර්ධනය වී ඇති බව ලෝක ජනගහන සංශෝධිත විවරණිකාවෙහි දක්වයි (World Population Prospects, 2017). දියුණු වෙමින් පවතින රටවල් ගත්විට ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශ වෙත ජනයා තල්ලු වීමේ වැඩි ප්‍රවනතාවක් දැකිය හැකිය. ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා රැකියා හිගය, අඩු අධ්‍යාපන පහසුකම් හා අවම සමාජ ආර්ථික පහසුකම් ආදිය මෙයට හේතු වේ. මේ නිසා නාගරීකරණයේ විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය.

- රටේ මුළු ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් නගරවල වාසය කිරීම
- නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් ප්‍රමාණය වැඩි වීම
- නුපුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණය වර්ධනය වීම
- රැකියා විරහිත විශාල තරුණ පිරිසක් බිහි වීම
- රැකියා නොමැති බව නිසා නීති විරෝධී ක්‍රියාවල නිරත වන පිරිස වැඩිවීම
- අඩු භූමි ප්‍රදේශයක් තුළ විශාල ජනගහනයක් එක් රැස් වීම තුළ සෞඛ්‍ය, අධ්‍යාපනික හා සමාජ ගැටලු ඇතිවීම (ද සිල්වා, 2004).

මෙසේ ග්‍රාමීය ජනයා නගරය වෙත සංක්‍රමණ වී සිය අවශ්‍යතා සපුරා ගන්නා තෙක් එහිම ස්ථානගත වීමට ගන්නා උත්සාහය මත නගරය තුළ දැඩි තදබදයක් හටගනී. එහි ප්‍රතිඵලයක් ලෙසට හටගන්නා වූ අනවසර පදිංචිවීම් ආදිය නිසාවෙන් පැල්පත් මුඩුක්කු ආදී ඉතා සුලු භූමි ප්‍රමාණයක විශාල පිරිසක් තාවකාලිකව නිවාස තනාගෙන ජීවත් වේ. මේ අඩු පහසුකම් සහිත ජනතාව නිසාවෙන් නගරය තුළ විවිධ ගැටලු රැසක් නිර්මාණය කිරීමට හේතු වේ. නාගරික සමාජ වැසියන් අතර එකිනෙකා කෙරෙහි පවත්නා සම්බන්දතාවයන් හෝ බැදීමක් දැකිය නොහැකිය. අනෙකුත් ගැටලු මෙන්ම නාගරීකරණය වර්ධනයත් සමඟ අපරාධ

වර්ධනයද සිදුව ඇත. නාගරික සමාජයේ අපරාධ වර්ධනය වීම නගරවල සාමය පවත්වාගෙන යාමට බාධාවක් වන්නා සේම විශේෂයෙන් කාන්තාවන්ට ජීවත් වීමට නුසුදුසු ස්ථානයක්බවට පත්ව ඇත. එදිනෙදා ජීවිතයේ පවත්නා තරගකාරිත්වය, පරිභෝජන ද්‍රව්‍ය පිළිබඳ අනිසි ලෙස සිතීම හා ඒවා අනිසි පරිදි රැස් කිරීම, ආත්මාර්ථකාමිත්වය, සාහසිකත්වය, සමාජ ආර්ථික විෂමතාව හා විරැකියාව හා තනිකම දැනීම වැනි හැඟීම් ආදිය නාගරික සමාජයේ අපරාධ වර්ධනය කෙරෙහි බලපිත මූලිකම හේතු සාධක බවට පත්ව ඇත. නගරයේ ජීවත්වන පීඩිතයන් හා මුඩුක්කු වැසියන් පමණක් නොව ඇතැම් විට සුඛෝපභෝගී ජීවිතයක අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා ධනවත් පැලැන්තියේ පවුල්වල තරුණයින්ද අපරාධ සඳහා යොමු වී ඇත. Dutt හා Venugopal (1983) සිදුකළ අධ්‍යයනයකට අනුව ඉංදියාවේ උතුරු මධ්‍යම ප්‍රදේශවලදී ප්‍රචණ්ඩකාරී නාගරික අපරාධ එනම් මිනී මැරීම්, පැහැරගැනීම්, මංකොල්ලකෑම්, දූෂණය කිරීම් වඩාත් කැපී පෙනෙන බවත් උතුරු මැද පළාත තුළ ආර්ථික අපරාධ එනම්, සොරකම, වංචා කිරීම, විශ්වාස බිඳ දැමීම ආදිය සිදු වන බව අනාවරණය කොට ගෙන ඇත. මෙම කලාපයේ පවත්නා දරිද්‍රතාවය නිසා ආර්ථික අපරාධ සිදුවන බව පැහැදිලිය (Chand, 2015). එසේම නගරය කේන්ද්‍රස්ථානය කොට ගනිමින් ජීවත් වන්නා වූ මාවත්වාසී ළමයින් අපරාධකරුවන්ගේ සුහුඹුල් අවධිය පසු කරමින් සිටින බවටත්, ඔවුන් විවිධාකාර අපචාරවලට සම්බන්ධ වන බවටත්, සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදු කරමින් නගරය තුළ ජීවත් වීම සැබෑ තත්ත්වයක් නොවන බවත් කොළඹ නගරය ආශ්‍රිතව ජීවත් වන මාවත්වාසී ළමයින් සම්බන්ධව සිදු කළ පර්යේෂණයක් තුළින් අනාවරණය කොට ඇත (විජේවර්ධන, 2016).

ඩේවිඩ් වෙයිස්බර්ඩ් (David Weisburd), ෂෝන් බුෂ්වේ (Shawn Bushway), සින්තියා ලුම් (Cynthia Lum) හා සූ-මින්ග් යන්ග් (Sue-Ming Young) විසින් 1987 දී **අපරාධ සිදු වන ස්ථානවල ක්‍රියාකාරිත්වය** පිළිබඳ වොෂිංටන් නගරයේ පර්යේෂණයක් සිදු කර ඇත. එහි සියැටල් වීදිවල අපරාධ ව්‍යාප්තිය වසර 34ක් පුරා සිදුව ඇති ආකාරය නිල අපරාධ දත්ත ඇසුරින් අධ්‍යයනය කොට ඇත. අපරාධ ප්‍රවණතා අධ්‍යයනය කිරීම සඳහා නගරයේ ඉතා කුඩා ප්‍රදේශ යොදා ගැණුනු අතර කණ්ඩායම් පාදක ඍජු විශ්ලේෂණ මෙම අධ්‍යයනය සඳහා යොදා ගැණුනි. එහිදී අනාවරණය වූයේ අපරාධ ක්‍රියාවන් ස්ථාවරව පවත්නා බවයි. සාපේක්ෂව ඇතැම් ස්ථානවල ප්‍රමාණයෙන් වැඩි හෝ අඩු වෙමින් පවතින අතර ඇතැම් ස්ථානවල පමණක් අපරාධවල ක්‍රමික අඩු වීමක් සිදුව ඇත. නමුත් මෙය සිදු වන ආකාරය තේරුම් ගැනීම අපහසු වනුයේ භූමියේ සිදු වන සුලු පරිමාණ වෙනස්කම් නිසාවෙනි (Weisburd, Bushway, Lum and Young, 1987).

නාගරීකරණය අපරාධවලට හේතු වේ යැයි නිශ්චිතව සඳහන් කළ නොහැක. නමුත් නාගරික අපරාධ ස්වයංක්‍රීයව සිදු නොවන අතර නගරය නිසි ලෙස සැලසුම් කර නොතිබුනේ නම් නාගරීකරණය අපරාධ සඳහා අනුබල ලබා දෙයි. නයිජීරියාවේ වර්ධනය වෙමින් පවතින ප්‍රධාන නගර එනම්, ලෝගොස්, උයෝ, කැල්බර් ආදි නගර නාගරික අපරාධ වර්ධනයට මුහුණ දෙමින් සිටී. මේ පිළිබඳ අධ්‍යයනයක නියැලුණු උක්බායි හා අනෙකුත් පර්යේෂකයින් නාගරීකරණය හා අපරාධ අතර සම්බන්ධතාවයක් පවතින බව දක්වා ඇත. නගරවල සිදුවන අධික ජනගහන වර්ධනය නිසාවෙන් වංචාකරුවන්ද සෑම විටම විශාල පිරිසක් සිටී. නයිජීරියානු නාගරික අංශයේ අවම වශයෙන් එක් හෝ අපරාධයක් දිනපතා සිදු වී ඇත. එහිදී මංකොල්ල කෑම් 27.3% කි. මේ සඳහා විරැකියාව හා දරිද්‍රතාව ප්‍රභල බලපෑමක් කරයි. මත්ද්‍රව්‍ය භාවිතය, මංකොල්ල කෑම් ආදියද මෙම හේතුව මත නිර්මාණය වේ (Ukvayi, Ojony and Anam, 2017). එසේම වර්තමානයේ නයිජීරියාවේ බොහෝ නාගරික මධ්‍යස්ථානවලදී අපරාධකාරී ක්‍රියාවන් හා ප්‍රචණ්ඩත්වය තුළින් භයානක ප්‍රතිඵල උද්ගත වී ඇත. මේ තුළින් පුද්ගල හා දේපළවලට හානි වීම මත සංහිඳියාව, සාමය, සමාජ පර්යාය මෙන්ම සමාජ ආරක්ෂාව කෙරෙහි තර්ජනයක් ඇති වේ. එසේම එමඟින් පුද්ගලයින්ගේ ජීවිතයේ ගුණාත්මකභාවයට හානි පමුණුවයි (Ahmed and Salihu, 2013).

අජාත් අහමඩ් මලික් (Ajas Ahmad malik) විසින් 2016 දී **නාගරීකරණය හා අපරාධ** පිළිබඳ සාපේක්ෂ විශලේෂණයක් සිදු කර ඇති අතර නාගරික සමාජයේ ග්‍රාමීය සමාජයට සාපේක්ෂව ඉතා ඉහළ අපරාධ මට්ටමක් පවතින බව සඳහන් කරයි. මෙසේ අපරාධ ඉහළ යාම කෙරෙහි ආර්ථික උද්ධමනය මෙන්ම ආදායම් අසමානතාව හේතු වේ. එසේම ආනුභවික අධ්‍යයනයක් සිදු කරමින් ඔහු තව දුරටත් නාගරීකරණය හා අපරාධ එකිනෙකට බැදුනාවූ නියාමනයන් බව අවධාරණය කොට ඇති අතර 2016 ට පෙර වසර කිහිපය තුළ නාගරීකරණය වූ ප්‍රදේශ තුළ අපරාධ අනුපාතයෙහි වර්ධනයක් සිදු වී ඇති ආකාරයක් (උදාහරණ - ඉංදියා රාජ්‍ය) දැක ගත හැකි බව දක්වයි (Malik, 2016).

අපරාධ නිර්මාණය කරනු ලැබූ භෞතික සාධක හඳුනා ගැනීම නමින් සිදු කළ පර්යේෂණය තුළින් අපරාධ සිදු වූ පරිසරයන් පිළිබඳ හදුනාගෙන ඇති අතර අපරාධ අඩු කිරීමට ගත යුතු භෞතික ක්‍රියාමාර්ග පිළිබඳ අවධාරණය කර ඇත. එනම්,

- පොදු ප්‍රදේශ අවම කිරීම
- පෞද්ගලික හිමිකම වැඩිකර ගැනීම
- පාරිසරික ප්‍රවේශවීම් හෙවත් පාරගම්‍යතාව අවම කිරීම

යනාදියයි (Saville and Sarkissian, 1998).

භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) මගින් නාගරික ඉඩම් භාවිතයේ බලපෑම සම්බන්ධව ලුඩින් සහ යූසොෆ් විසින් පර්යේෂණක් සිදු කර ඇති අතර එමගින් ඉඩම් පරිහරණ හා සැලසුම්කරණය මත සමාජයේ සිදුවන මත්ද්‍රව්‍ය හා අනෙකුත් අපරාධ පිළිබඳ අධ්‍යයනය කෙරේ. අපරාධ ක්‍රියා හා භෞතික හෝ සමාජ අවකාශය අතර මැනිය හැකි සබඳතාවක් පවතින බව අවධාරණය කොට ඇත. එමෙන්ම අවස්ථාමය න්‍යායයට (Opportunity Theory) අනුව අපරාධ ඝනත්වය හා ජනගහන ඝනත්වය සංකල්පමය වශයෙන් සම්බන්ධ වන බවයි. එසේම අපරාධ කරුවන්ට අපරාධ සිදු කිරීමට පවත්නා හොඳම මාර්ගයන් වන්නේ අධික රථවාහන තදබදය සහිත මාර්ග, පදික පාලම් සහ බස් නැවතුම්පොලවල් ආදියයි (Ludin, Aziz, Yusoff and Razak, 2013).

ශ්‍රී ලංකාවේ අපරාධ කෙරෙහි බලපෑ හේතු සාධක පිළිබඳ සිදු කළ පරියේෂණයකදී නාගරික සමාජයේ පවතිනා වූ ස්ත්‍රී දූෂණ හා මිනී මැරුම් සඳහා බලපාන්නා වූ සාධකයන් පිළිබඳ අධ්‍යයනය කොට ඇත. එහිදී එම අපරාධයන් සිදු කිරීමට අපරාධකරුගේ සමාජීය පරිසරයේ බලපෑම කෙරෙහි අවධානය යොමු කොට ඇත. එහිදී අනාවරණය වූයේ අපරාධකරුවන්ගේ පහළ අධ්‍යාපන මට්ටමත් පහළ ආර්ථික තත්ත්වයත් හේතු වූ බවයි.(ජයතුංග, 2010). නාගරික තරුණ කල්ලි ආශ්‍රිත සමාජ විරෝධී හැසිරීම් රටාවන් හා ඒවායෙහි බලපෑම පිළිබඳ සිදු කළ අධ්‍යයනය තුළින් අවධාරණය කළ කරුණු වූයේ තරුණ කල්ලි බිහිවීම සඳහා නාගරික භූගෝලීය පසුබිම හැඩගැසී ඇති ආකාරයත් නාගරික භෞතික පරිසරය සහ කල්ලි හැසිරීම්, චර්යා රටා අතර වූ සම්බන්ධයත් කල්ලි අපරාධවලින් නාගරික පරිසරයට ඇති බලපෑමත් යනාදිය පිළිබඳ අවධාරණය කර ඇත (Wjjewardhena, 2015).

නාගරීකරණය හේතු කොට ගෙන සමාජය තුළ විවිධ අවස්ථාවන් පුද්ලයන්ට හිමි වේ. එනම් රැකියා, උසස් අධ්‍යාපන, නිවාස වඩා පහසු ගමනාගමන සහ රාජ්‍ය පරිපාලනමය කටයුතු පහසු කර ගැනීමද මෙ තුළින් සිදු වේ. නගර ආශ්‍රිත වැසියන්ට මෙම ආර්ථික තත්ත්වයන් ළගා කර ගැනීමට නොහැකි වීම මත ඇතිවන සමාජීය ගැටලු බොහෝ ලෙස වාර්තා වේ. ඒ අතර අපරාධ ප්‍රමුඛ ස්ථානයක් ගනී. බොහෝ ආනුබවික අධ්‍යයනයන් මගින් වාර්තා වී ඇති පරිදි නාගරික ප්‍රදේශවල අපරාධ සිදුවීමේ ප්‍රනතාව ඉතා ඉහළ මට්ටමක පවතින ආකාරයක් පෙනේ. නාගරීකරණය සහ අපරාධ අතර සබඳතාවක් පවතින්නේද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව විය. නාගරීකරණය සහ අපරාධ අතර පවත්නා සබඳතාව හඳුනාගනිමින් ඒවා වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. නාගරික සමාජයේ පවත්නා අපරාධ

ක්‍රියාත්මක වීම සඳහා එම පරිසරය අනුබලයක් ලබා දෙන්නේද යන්නත් නාගරීකරණය හේතු කොටගෙන අපරාධ ප්‍රවණතාව කවරේද යන්නත් මෙහිදී සුවිශේෂී අරමුණු වශයෙන් අධ්‍යයනයට බඳුන් කරන ලදි.

**ක්‍රමවේදය**

ක්‍රමවේදය පියවර 4ක් ඔස්සේ සිදු කරනු ලබූ අතර පළමු පියවර යටතේ ක්ෂේත්‍රය තෝරා ගැනීම සඳහා අපරාධ කොට්ඨාස විමර්ශන වාර්ත මඟින් වැඩිම අපරාධයන් සිදුවන දිස්ත්‍රික්කය තෝරා ගැනීමට සිදු විය. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ අපරාධ වැඩිම ලෙස වාර්තාවන දිස්ත්‍රික්කය වූ අතර එහි ප්‍රධාන වානිජ මධ්‍යස්ථානයන් වන කොළඹ කොටුව සහ පිටකොටුව ප්‍රදේශ පර්යේෂණ ක්ෂේත්‍ර ලෙස තෝරා ගැණුනි. කොළඹ, අපරාධ වාර්තා කොට්ඨාසයේ සංඛ්‍යා දත්ත සහ අපරාධ වාර්තා අනුව වැඩිම අපරාධ ප්‍රමාණයක් වාර්තා වී ඇති කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රිතව මෙම පර්යේෂණය සිදු කෙරුණි. කොටුව සහ පිටකොටුව පොලිස් ස්ථානයන් වෙත වාර්තා වූ අපරාධ මෙන්ම අපරාධ ස්ථාන වාර්තා කොට්ඨාසය වෙත වාර්තා වූ අපරාධ මෙහිදී ප්‍රධාන වශයෙන් ද්විතීක දත්ත ලෙස යොදා ගැණුනි. කොළඹ, අපරාධ වාර්තා කොට්ඨාසයේ සංඛ්‍යා දත්ත සහ ක්ෂේත්‍රයේ පොලිස් ස්ථානයන්හි අපරාධ වාර්තා අනුව වැඩිම අපරාධ ප්‍රමාණයක් වාර්තා වී ඇති කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රිතව මෙම පර්යේෂණය සිදු කෙරුණි. මෙහිදී ද්විතීක දත්ත මෙන්ම පොලිස් නිලධාරින් සහ ප්‍රජාව සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලී මඟින් ලබා ගත් දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගැණුනි.

දෙවන පියවර වශයෙන් අදාළ ක්ෂේත්‍රය නිරීක්ෂණයට බඳුන් කරනු ලැබූ අතර පූර්ව අධයයනක් (Pilot Survey) ක්ෂේත්‍රය තුළ සිදු කරමින් ප්‍රශ්නාවලිය සෑදීමට අවශ්‍ය දත්ත රැස් කර ගන්නා ලදී. එසේම පොලිස් වාර්තාවන් පරිශීලනය තුළින් ද දත්ත ලබා ගැණුනි. එමෙන්ම පොලිස් නිලධාරින් සමඟ සිදු කළ විධිමත් සම්මුඛ සාකච්ඡා මඟින් ද තව දුරටත් දත්ත සපයා ගැණුනු අතර අදාළ ක්ෂේත්‍රයේ වෙළදාමේ නියුතු කඩ හිමියන්, වීදි වෙළෙන්දන් සහ නාගරික වැසියන්ගෙන් ප්‍රශ්නාවලී මඟින් තෙවන පියවරේදී තොරතුරු සපයා ගන්නා ලදි. දත්ත රැස් කිරීම තරමක් අපහසු කාර්යයක් වූ නිසාවෙන් ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කර ඇති පළපුරුදු කණ්ඩායමක් මේ සඳහා යොදා ගැනීමට සිදු විය. එහිදී පර්යේෂණ සහකාරවරුන් සහ සහය කථිකාචාර්යවරුන් ලෙස සේවය කරනු ලබන්නන්ගේ කණ්ඩායමක් යොදා ගනිමින් පරයේෂණය දියත් කරනු ලැබූ අතර එනිසාම ඔවුන් හරහා ලබා ගන්නා කරුණු වල නිරවද්‍යතාව තව දුරටත් සනාථ කරගත හැකිවිය.

සිව්වන පියවර වශයෙන් ලබා ගන්නා ලද තොරතුරු වල සත්‍ය අසත්‍යතාව සනාථ කර ගැනීම සඳහා ක්ෂෙත්‍රයට ගොස් අපරාධ බහුලව සිදුවන ස්ථානවල ගැවසෙමින් ස්ථානීය නිරීක්ෂණයක් සිදු කල අතර එමඟින් ප්‍රජාවගෙන් ලබා ගැණුනු තොරතුරු තව දුරත් සහභාගිත්ව නිරීක්ෂණය මඟින් තහවුරු කර ගැණුනි.

පර්යේෂණයේ නියැදිය සඳහා වෙළඳ ප්‍රජාව 50 ක්ද නාගරික පදිංචිකරුවන් 50 දෙනෙක්ද පොලිස් නිලධාරින් 30ක් ද යොදා ගැණිනි. එමෙන්ම 2010 සිට 2018 දක්වා කොටුව සහ පිටකොටුව ප්‍රදේශයන්ගේ පොලිස් ස්ථාන වෙත වාර්තා වූ අපරාධයන්ගේ සංඛ්‍යාත්මක දත්ත සහ ඒවායේ රටාවන් පිළිබඳව ද විශ්ලේශනය කරන ලදි. එම දත්ත විශ්ලේශනය සඳහා SPSS මෘදුකාංගය යොදා ගැණුනි.

**ප්‍රතිඵල සහ සාකච්ඡා**


පර්යේෂණය තුළින් කොළඹ නාගරික පරිසරය මුල් කොට ගෙන නිර්මාණය වී ඇති සමාජ ප්‍රශ්න මෙන්ම අපරාධ පිළිබඳ බොහෝ කරුණු අනාවරණය කර ගත හැකි විය. සාහිත්‍ය විමර්ශන තුළින් අනාවරණය කර ඇති පරිදිම නාගරීකරණය හේතු කොට ගෙන බොහෝ අපරාධ සිදු වන බව මෙම

පර්යේෂණය තුළින් අනාවරණය විය. විශේෂයෙන්ම නාගරික සමාජයේ සිදුවන අපරාධයන්ට ප්‍රධානතම හේතුව ලෙස ප්‍රජාවගෙන් ලැබුණු පිළිතුරු වූයේ  මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව අධික වීමයි. විශේෂයෙන් තොග බඩු කඩවලට රැගෙන යන නාට්ටාමීන් ලෙස සේවයේ යෙදෙන්නන්ගෙන් බහුතරය මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් වේ. ඔවුන්ගේ හැසිරීම් ස්වභාවයන්හි වෙනස්කම් ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී තහවුරු විය. ඔවුන් භාවිතා කරන මත්ද්‍රව්‍ය අතර කුඩු, ගංජා, අබිං, ඇපල් (මත්ද්‍රව්‍ය වර්ගයක්) ආදිය ප්‍රධාන විය. මෙම මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඔවුන් නිරන්තරයෙන් සොරකමට පෙළෙඹෙන බව අනාවරණය විය.  පිටකොටුව ගුණසිංහපුර බස් නැවතුම්පොලෙහි පළතුරු වෙළඳාමේ නිරත වෙළෙන්දකු සිය අත්දැකීම් පර්යේෂණය තුළදී අනාවරණය කළේ පහත පරිද්දෙනි.

> *''නෝනත් එක්ක මේ කතා කරන ටික ඇති මෙතන මොනා හරි නැති වෙන්න.*
> *අපි දිහා දැන් මේ තත්පරේට 100ක් විතර බලාගෙන ඇති කුඩු කාරයෝ. මේ*
> *ඊයේ පෙරේදා මං ඔහොම එක්කෙනෙක් එක්ක කතා කර කර ඉන්න ටිකට*
> *උස්සලානේ ඇපල් පෙට්ටි 2ක්ම. එකක් රුපියල් 6000 ක් වෙනවා. ඉතිං*
> *නෝනා තවත් මොන කතාද..... මේකේ හැම තැනම ඉන්නේ කුඩු කාරයෝ*
> *තමයි''*

ක්ෂේත්‍ර නිරීක්ෂණයේ දී ද එහි පවත්නා අනාරක්ෂිත බව තව දුරටත් අවබෝධ කොට ගත හැකි විය. ඉටිරෙදි වලින් වටකර සැලසුමකින් තොරව ඉදි කර ඇති කඩවලට පවා CCTV ආරක්ෂිත කැමරා සවිකර ඇති ආකාරයක් නරීක්ෂණය වීමෙන් පැහැදිලි වනුයේ කොළඹ නගරය තුළ පවත්නා දැඩි අනාරක්ෂිත බවයි. එමෙන්ම අපරාධ සිදුවන ස්ථාන බොහෝමයක් දත්ත දායකයින් විසින් අනාවරණය කරනු ලැබූයේ පොදු ජනයා බහුල වශයෙන් ගැවසෙන ස්ථාන වන බස් නැවතුම් පොළ, පිටකොටුව බෝ ගහ අසල, ස්වයං රැකියා වෙළඳ මධ්‍යස්ථානය මෙන්ම ප්‍රධාන වීදියේ බවයි.


**සිතියම් අංක 01- කොටුව හා පිටකොටුව ප්‍රදේශයේ අපරාධ සිදුවන ස්ථාන 2017-2018**




**(දත්ත දායකයා විසින් සම්පාදිතයි, 2018)**

දත්ත විශ්ලේශනය හරහා නාගරික පරිසරය තුළ වාර්තා වන අපරාධ රටාවන් මෙන්ම ඒවායේ ප්‍රවණතාවන් කවරේද යන්න පහත ප්‍රස්ථාරය තුළින් හඳුනාගත හැකි වේ.

***වගු අංක 01 - කොටුව සහ පිටකොටුව ප්‍රදේශයේ අපරාධ වාර්තා***




(කොටුව හා පිටකොටුව පොලිස් වාර්තා, 2018).

පොලිස් වාර්තාවලට අනුව වැඩි වශයෙන්ම අපරාධ වාර්තා වන්නේ පිටකොටුව ප්‍රදේශ තුළයි. පොලිස් නිලධාරීන්ගෙන් ලද දත්තයන්ට අනුව මේ සඳහා හේතු වූයේ කොටුව ප්‍රදේශයට වඩා පිටකොටුව ප්‍රදේශය වානිජමය මධ්‍යස්ථානයක් වීමයි. ඉතාමත් ව්‍යාකූල මෙන්ම භාණ්ඩ ලබා ගැනීමට පැමිණෙන ජනයාගෙන් ගහන වූ ඉතාම ගෝෂාකාරී ප්‍රදේශයකි. මෙම ප්‍රදේශය සියලු ගණයේ භාණ්ඩ එනම් ප්ලාස්ටික් භාණ්ඩයන්ගේ සිට යාන්ත්‍රික භාණ්ඩ, තොග මෙන්ම සිල්ලර වශයෙන්ද විකුණනු ලබන ඉතා පටු බිම් කොටසකින් යුක්ත වූ ප්‍රදේශයකි. එම තොග බඩු මිලදී ගැනීමට පැමිණෙන පුද්ගලයන් මෙන්ම ලංකාවේ රැකියා සඳහා කොළඹ ප්‍රදේශයට පැමිණෙන පුද්ගලයන්ගේ ප්‍රධාන හුවමාරු මධ්‍යස්ථානයක් වන්නේද පිටකොටුවයි. මේ හේතු කොටගෙන පැමිණෙන ජනයා අලලා සොරකම් සහ මංකොල්ලකෑම් බහුල වශයෙන් සිදු වන බව වාර්තා වේ. උක්ත ප්‍රස්ථාරයේ සඳහන් පරිදි මෙම ප්‍රදේශය තුළ සිදුව ඇති අපරාධයන්ගෙන් බහුතරයක් (49%) ක් සොරකම් විය. ඒ අතර කොල්ලකෑම් සහ වංචාවන්ද බහුල විය.

කොළඹ නගරයේ පවත්නා වූ අවිධිමත් පැල්පත් හා පේළි නිවාසවල ජීවත් වන අඩු ආදායම් ලබන්නන් අපරාධ සඳහා බහුල වශයෙන් යොමු වන ආකාරයක් දැකිය හැකිය. දෛනිකව විශාල පිරිසක් වෙළඳ කටයුතු හා කාර්යාල කටයුතු සඳහා කොටුව ප්‍රදේශයට රැස්වීම නිසා දැඩි මාර්ග තදබදයක් හා සනත්වයක් හට ගනී. මෙසේ පටු සීමාවක් තුළ සිදු වන්නා වූ මෙම තදබදය අපරාධ ඇති වීම කෙරෙහි අනුබලයක් ලබා දෙයි. නාගරික පරිසරය තුළ අපරාධ බහුලවීම කෙරෙහි වින්දිතයාද ප්‍රභල බලපෑමක් සිදු කරන බව වෙළඳ ප්‍රජාව තුළින් අනාවරණය විය. ඔවුන්ගේ අවධානය දුර්වල වීම මෙන්ම නොසැලකිලිමත් කම මේ සඳහා හේතු වන බව දත්ත දායකයින්ගෙන් 86%ක් ප්‍රකාශ කරන ලදී.

එසේම අවුරුද්දේ කාල වකවානු අනුව අපරාධ සිදු වීමේ ප්‍රවනතාවන්ගේ යම් වෙනස් වීමේ රටාවක් අනාවරණය විය. උත්සව කාල වකවානු වලදී අනෙකුත් මාසවලට සාපේක්ෂව අපරාධ වර්ධනය වීමක් දැකිය හැකිය. සිය අවශ්‍යතාවන් සපුරා ගැනීමට සහ අනන්‍යතාවය සඟවා කටයුතු කළ හැකි පරිසරයක් නාගරිකබව තුළ තිබීම මත අපරාධ කෙරෙහි යොමුව මත්ද්‍රව්‍ය භාවිතය, ගණිකා වෘත්තිය, මිනීමැරීම්, මංකොල්ලකෑම් සහ ස්ත්‍රී දූෂණ ආදී අපරාධ සිද්ධීන් ඒ අතර ප්‍රධාන වී ඇත. පටු මංමාවත්, ගරා වැටුණු ගොඩනැගිළි තුළ සහ අපරාධ කිරීම සඳහා නිර්මාණය කරගත් ඇතැම් ස්ථාන (Hotspot) මූලික කරගෙන අපරාධයන් බහුලව සිදුවන බව නිරීක්ෂණය විය. නගරාශ්‍රිතව අපරාධ පාලනය කිරීමෙහිලා නගර සැලසුම්කරණ ක්‍රියාවලිය නිසි පරිදි සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. ලෝකයේ

බොහෝ රටවල් වර්තමානයේ පාරිසරික සැලසුම් මගින් අපරාධ වැළැක්වීමේ ක්‍රමය (CPTED) යොදා ගනිමින් නාගරික අපරාධ වැළැක්වීම පිළිබඳ අවධානය යොමු කිරීම කාලෝචිතය.

**සාරාංශය**

කොළඹ නගරයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් වන කොටුව හා පිටකොටුව ප්‍රදේශ තුළට දිනකට රැස් වන්නා වූ අධික ජන සංඛ්‍යාව මෙන්ම ඒ උදෙසා දිනෙන් දින අක්‍රමිකව ඉදිවන සේවා ආයතන නිසාවෙන් නාගරීකරණය උග්‍ර වෙමන් පවතී. කොළඹ නගරය තුළ ක්‍රමිකව වර්ධනය වන්නා වූ ජනගහනය හේතුවෙන් ප්‍රදේශය නාගරීකරණයට බඳුන් වන අතර ක්‍රමවත් සැලසුම් කිරීමකින් තොරව නගරය පුලුල් වීම මත ගොඩ නැගෙන්නා වූ සමාජ ගැටලු රාශියකි. මත්ද්‍රව්‍ය භාවිතය, ගණිකා වෘත්තිය, මිනීමැරීම් සහ මංකොල්ලකෑම් විශාල වශයෙන් වර්ධනය වී ඇත. ඉතා පටු වීදි සහ භාවිතයට නොගන්නා වූ පරණ ගොඩනැගිලි මෙන්ම අනවසර ලෙස ඉදිකර ඇති පැල්පත් හා මුඩුක්කු අපරාධ සිදු කිරීමට තෝතැන්නක් වී ඇත. ලෝකයේ බොහොමයක් රටවල් වර්තමානය වන විටත් පරිසරය සැලසුම් කිරීම හරහා අපරාධ අවම කිරීමේ සංකල්පය (CPTED) යොදා ගෙන ඇත. එහිදී අපරාධකරුවාට අපරාධ සිදු කිරීමට ඇති ඉඩකඩ අවම කිරීමක් විවිධ ක්‍රමයන් ඇසුරු කරගනිමින් සිදු කරනු ලබන අතර අපරාධකරුවාගේ මනෝ භාවයන් වෙනස් කිරීම් පරිසරය හරහා සිදු කිරීම කෙරෙහිද එහිදී යොමුව ඇති ආකාරයක් පැහැදිලි වේ. වර්ධනය වන්නා වූ අපරාධයන් පාලනයෙහිලා කොළඹ නාගරික සැලසුම්කරණය සඳහා CPTED ක්‍රමය යොදා ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීම කාලෝචිත වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

අපරාධ කොට්ඨාස වාර්තා, (2018). අපරාධ වාර්තා කොට්ඨාසයඃ කොළඹ.

***ජන හා නිවාස සංගණන වාර්තාව,*** (2012). ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

ද සිල්වා, අයි. (2004). ***ජනගහන අධ්‍යයනය ශ්‍රී ලංකාව ඇසුරෙන්.*** කොළඹඃ කතෘ ප්‍රකාශනයක්.

විජේතුංග, එච්. (2008). ***ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය.*** කොළඹඃ ගුණසේන සහ සමාගම.

විජේවර්ධන, එන්. (2016). ***දූවිලි මල්ඃ මාවත්වාසී ළමයින් පිළිබඳ පර්යේෂණාත්මක විවරණයක්.***_කොළඹ 10ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්ගලික) සමාගම.

සමරකෝන්, එම්. (2009). ***නාගරික සමාජ විද්‍යාව.*** කතෘ ප්‍රකාශන.

Ahmed, M., and Salihu, R.S. (2013). Spatiotemporal pattern of crime using geographic information system (GIS) approach in Dala L.G.A of Kano State, Nigeria. ***American Journal of Engineering Research (AJER)***, 2 (3), 51-58

Gelles, J. R., & Levine A. (1999). ***Sociology an introduction***. United States of America: McGraw-Hill.

Gordon, M., & David S. (2014)**. *Urbanization Concept and Trends*.** London: IIED working paper IIED.

Chand, S. (2015). ***11 Major Problems of Urbanization in India*.** Available on **https://www.scribd.com/document/290166926/11-Major-Problems-of-Urbanisation-in-India** (25/07/17)

Ludin, A. N. M., Aziz, N. A., Yusoff, N. and Razak, W. J. W. A., (2013). Impacts of Urban Land Use on Crime Patterns Through GIS Application. *Geographical analysis in urban planning, 2, 1-22.*

Rikesh, K. (2009)**. *What is Urbanization*.** Available on https://www.conserve-energy future.com/causes-effects-solutions-urbanization.php#abh_posts (15/12/2016)

Saville, G., and Sarkissian, W. (1998). Review of Creating Defensible Space by Oscar Newman, ***Journal of Planning Education and Research***, 17 (4), 361-363.

Schubert, J. (n.d). ***What Is Culture Conflict? - Definition, Theory & Example.*** **Available on https://study.com/academy/lesson/what-is-culture-conflict-definition-theory-example.html#transcriptHeader (18/08/2017)**

Malik, A.A. (2016).Urbanization and Crime: A Relational Analysis. ***IOSR Journal Of Humanities And Social Science (IOSR-JHSS)***, 21, 68-74.

Ukwayi, J.K., Ojong, F.E., & Anam, B.E. (2017). Urbanization and Crime in Nigeria: Addressing Key Challenges of Development Administration. ***International Journal of Advanced Research in Social Sciences, Environmental Studies & Technology***, 3,107-119.

Wijewardena, B.V.N. (2015). ***The Impact of Youth Ganging on Anti-Social Behavior:A Criminology Study in Colombo City of Sri Lanka***, The Faculty of Graduate Studies, University of Sri Jayewardenepura for the award of the Degree of Doctor of Philosophy in Criminology.

***World Polulation Prospect***, (2017). Available on https://esa.un.org/unpd/wpp/publications/Files/WPP2017_KeyFindings.pdf (18/05/2017)

Worth, L. (1938). Urbanism as a way of life**. *American Journal of Sociology***, 44, 1-24.